මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

නිකුත් කළේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව
දිනය 2025 මාර්තු 14

**2025 මාර්තු 12 දින පවත්වන ලද භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව**

2025 මාර්තු මස 12 දින පවත්වන ලද භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසියේදී සුරැකුම්පත් හඳුනා ගැනීමේ ජාත්‍යන්තර අංක වන LKB00529L150, LKB00832L158 සහ LKB01534I155 දරන භාණ්ඩාගාර බැඳුම්කර සඳහා සෘජු නිකුතු කවුළුව ඔස්සේ ලද රුපියල් මිලියන 133,683ක මුළු ලංසු ප්‍රමාණය අතුරින්, පිළිගත හැකි උපරිම වටිනාකම වන රුපියල් මිලියන 21,000ක් (පිළිවෙලින්, රුපියල් මිලියන 8,500ක්, රුපියල් මිලියන 7,500ක් සහ රුපියල් මිලියන 5,000ක් බැගින්) එම වෙන්දේසියේදී අදාළ සුරැකුම්පත් කාණ්ඩ සඳහා තීරණය කරන ලද බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතික වන 10.72%, 11.40% සහ 11.50% යටත්ව පිළිගන්නා ලදී.

ඉහත නිකුතුව සඳහා ගෙවීම් කළ යුතු දිනය 2025 මාර්තු 17 වේ.